# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2099/3 - 2018 නොවැම්බර් මස 26 වැනි සඳුදා - 2018.11.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කරගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මාගේ අංකය:* ARA/LND /ACQVI /D3/42.

*ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ අංකය:* 4-3/ 15 /2016/VE /415.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු ඉඩමේ විස්තර:*

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගල්බොඩ කෝරළේ (බටහිර) අංක 44 ඒ, හබලක්කාව ග්‍රාම නිළධාරී කොට්ඨාසයේ, තැඹරව ගමේ පිහිටි ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් 2018.10.08 දිනැතිව පිළියෙල කරන ලද අංක මු.පි.කෑ. 3615 දරන මූලික පිඹුරේ කැබලි අංක 01 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.3284 පමණ වූ කොබේකඩුවේහේන නැමැති ඉඩම සඳහා මායිම්.

01. කැබලි අංක 01
ඉඩමේ නම: කොබේකඩුවේහේන; ප්‍රමාණය: හෙක්. 0.3284.

*මායිම්:*

උතුරට: කොබේකඩුවේහේන සහ බකුල්වල ගම් මායිම; නැගෙනහිරට: කෑ.3573 වැනි මූලික පිඹුරේ 4 වැනි බිම් කැබැල්ල; දකුණට: අලුත්දුරයලාගේ හේන; බටහිරට: අලුත්දුරයලාගේ හේන සහ කොබේකඩුවේහේන.

වෙනත් කරුණු - ඉඩම් අත්කර ගන්නා පනතේ 38 (අ) වගන්තිය යටතේ පවරා ගන්නා ලදී. මුල් හිමිකම් පාන්නේ අරණායක, දෙමළහිරිය, F 07 හි පදිංචි එම්.එම්.කේ. දයාරත්න. අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2018 දෙසැම්බර් මස 20 වැනි දින පෙ.ව. 10.00 ට අරණායක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2018 දෙසැම්බර් මස 13 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම



මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් පිටපත් දෙකක් සහිතවූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ඉසෙඩ්. ඒ. එම්. ෆයිසල්,
ප්‍රාදේශීය ලේකම්,
අරණායක.

2018 ක් වූ නොවැම්බර් මස 25 වැනි දින,
අරණායක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

12 - 191

---

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය:* BD/EL /LND /2/AQUSN/02.

*ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ යොමු අංකය :* LD/05/2005/H /395.

උක්ත ශීර්ෂය යටතේ අංක 1875/31 හා 2014 අගෝස්තු මස 14 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ* ගැසට් පත්‍රයේ පළ කරන ලද ඉහත සඳහන් දැන්වීමෙහි සඳහන් පිඹුරු අංකයන් සහ දිනයන් ඉවත්කොට ඒ වෙනුවට වෙනත් පිඹුරු අංකයන් හා දිනයන් ආදේශ කිරීමෙන් පහත සඳහන් සංශෝධනය කරන බව මෙයින් දැනුම්දෙනු ලැබේ.

| | |
|---|---|
| ඉවත් කළ යුතු පිඹුරු අංකය: B/ELL/2008/148 | ඉවත් කළ පිඹුරු අංකය වෙනුවට ආදේශ කළ යුතු පිඹුරු අංකය: අ.ග.සි.36, පත්‍රය 51, අතිරේකය 49 |
| ඉවත් කළ යුතු පිඹුරේ සඳහන් දිනය: 2013.05.15 | ඉවත් කළ පිඹුරේ සඳහන් දිනය වෙනුවට ආදේශ කළ යුතු දිනය: 2008.11.18 |
| ඉවත් කළ යුතු පරීක්ෂණ දිනය: 2014 සැප්තැම්බර් මස 15 | ඉවත් කළ පරීක්ෂණ දිනය වෙනුවට ආදේශ කළ යුතු පරීක්ෂණ දිනය: 2019.01.23 |
| ඉවත් කළ යුතු ලේඛන භාරදීමේ දිනය: 2014 සැප්තැම්බර් මස 15 | ඉවත් කළ ලේඛන භාරදීමේ දිනය: වෙනුවට ආදේශ කළ යුතු ලේඛන භාර දීමේ දිනය: 2019.01.17 |

කේ. ඒ. ජේ. ප්‍රියංගිකා,
ප්‍රාදේශීය ලේකම්,
ඇල්ල.

ඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

12 - 192

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.